tamilguru.lk

**අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා වූ සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය - 2024

Link Language (English) Test for Sri Lanka Teacher Educators Service - 2024

අංක 1925/37 හා 2015 ජූලි මස 28 දිනැති ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරින් සඳහා වූ සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය **2025 ජනවාරි මස කොළඹ දී** පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams/ E. B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2024 නොවැම්බර් මස 22 වැනි දින පෙ. ව. 9.00 ට විවෘත වන අතර 2024 දෙසැම්බර් මස 20 වැනි දින ප. ව. 9.00 ට** අවසන් වේ.

අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙ හි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

02. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සෑම නිලධාරියකුම බඳවා ගැනීමේ දින සිට වසර තුනක් (03) ඇතුළත සන්ධාන භාෂාවවන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු ය. අංක 1925/ 37 හා 2015.07.28 දිනැති ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ 9.1 වගුවේ අංක 3 යටතේ දක්වා ඇති සුදුසුකම් සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 08/2020 හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති නිලධාරින් මෙම සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරින් මෙම පරීක්ෂණය සමත් විය යුතු ය.

03. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1925/37 දරන 2015 ජූලි මස 28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම

විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

04. විභාග පටිපාටිය - ලිඛිත පරීක්ෂණය :

| විෂයය අංකය | විෂයය | ලකුණු | කාලය (පැය) |
|---|---|---|---|
| 01 | ඉංග්‍රීසි භාෂාව | 100 | 02 |

05. විෂය නිර්දේශය :-

5.1 English Grammar :

A suitable level of proficiency on the following forms of grammar in the spoken and the written language is expected from the candidate.
- Tense and Number
- Sentences (Simple / Compound/ Complex/ Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

5.2 Writing Skills :

The knowledge on the modern formats and styles of writing is tested in this area of study.
- Essay Writing
- Summary writing skills
- Report writing skills
- Letter writing

5.3 Reading skills :

Candidate's ability to comprehend a printed text, infer meaning and written interpretation is expected.
- Reading and understanding the specific and general meaning of a printed text
- Reading and Interpretation (written)

06. විෂයය සාමාර්ථය ලැබීම සඳහා අයදුම්කරුවකු අවම වශයෙන් 40% හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

07. විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ලේකම්, අධ්‍යාපන විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාග අයදුම්කරුවන් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු නොකරනු ඇත.

08. මාර්ගගත (Online ) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව සිදු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශවීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E - mail) ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සළකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ද භාරගනු නොලැබේ.

මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

09. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අයදුම්කරුවන් බැඳී සිටී. විභාගය සඳහා වන නීති රීති පහත පළ කොට ඇත.

10. **ව්‍යාජ තොරතුරු සැපයීම** - අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත් ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය.

11. අයදුම්පතේ මුද්‍රිත පිටපත **2024 දෙසැම්බර් මස 20 වැනි දින** හෝ ඊට ප්‍රථම, "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ ලිපිනයට ලැබෙන පරිදි පීඨාධිපති / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් පමණක් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. විභාගයේ නම කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය. මෙදින ට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් විභාගය සඳහා අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ

එදිනට පෙර නියමිත ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන දැන්වීමක් මගින් දැනුම් දෙනු ලැබේ. එම නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ඇතුළත තම ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එම පුවත්පත් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම්කළ විභාගයේ නම සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද, සහිත ඉල්ලීමේ ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසීම වඩාත් එලදායී වේ.

විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

**සටහන :** ඉහත 12 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අයදුම්කරුවන් විසින් පසුව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි පිළිබඳව සලකා බලනු නොලැබේ.

13. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

14. අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙකු ම විභාගයේ පළමු වැනි දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතු ය. විධිමත් පරිදි තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

15. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අයදුම්කරුවන්ගේ වගකීම වේ. ඒ සඳහා,

i. ජාතික හැඳුනුම්පත, හෝ
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය, හෝ,
iii. වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදනය උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගැනීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

16. **විභාග ගාස්තු :**

(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(ආ) පළමුවැනි වතාවේ දී ගාස්තු අයකරනු නොලැබේ.

(ඇ) ඊට පසු එක් එක් වතාව සඳහා රු. 250.00 බැගින් අය කරනු ලැබේ.

විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

**සටහන :**

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් සිදු කරනු නොලැබේ.

17. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

18. සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

19. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

ජේ. එම්. තිලකා ජයසුන්දර,  
ලේකම්,  
අධ්‍යාපන විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය.

2024 නොවැම්බර් මස 12 වැනි දින,  
පැලවත්ත, ඉසුරුපාය,  
අධ්‍යාපන විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා වූ සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය - 2024**

Link Language (English) Test for Sri Lanka Teacher Educators Service - 2024

1. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..............................

(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..............................
..............................
(උදා : GUNAWARDHANA H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) ..............................

2. (i) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ ශ්‍රේණිය : ..............................
(ii) විද්‍යාපීඨය / ගුරු විද්‍යාලය / ගුරු මධ්‍යස්ථානය ..............................
(iii) කලාප අධ්‍යාපන කාර්යාලය :..............................
(ගුරු විද්‍යාලය / ගුරු මධ්‍යස්ථාන නිලධාරීන් සඳහා පමණි.)

3. ලිපිනය :

i. පෞද්ගලික : ..............................
ii. රාජකාරී : ..............................
iii. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ..............................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
iv. රාජකාරී දුරකථන අංකය : | | | | | | | | | | |

v. ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

4. (I) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

(II) උපන් දිනය : ..............................

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

(III) ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5. විභාග ගාස්තු ගෙවා ලබා ගත් ලදුපතේ විස්තර :
ලදුපත් අංකය : ...............................
තැපැල් කාර්යාලය : .....................................
දිනය : .....................................................

| ලදුපත මෙහි අලවන්න |
| --- |

6. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.................................... ..............................................
දිනය අයදුම්කරුගේ අත්සන

7. *විභාග කොමසාරිස් ජනරාල්,*

ඉහත විස්තර දැක්වෙන අයදුම්කරු මෙම විද්‍යාපීඨයේ/ ගුරු විද්‍යාලයේ / ගුරු මධ්‍යස්ථානයේ නිලධාරියකු බව සහතික කරමි. තව ද අයදුම්කරු විභාග ගාස්තුවෙන් නිදහස් බව ද,/ අයදුම්කරු විභාග ගාස්තු ගෙවා එම ලදුපත නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

.................................................................................

පීඨාධිපතිගේ/ ගුරු විද්‍යාල විදුහල්පතිගේ/ ගුරු මධ්‍යස්ථාන කළමණාකරුගේ/
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන

ලිපිනය : ...........................................
දිනය :........................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න) (අදාළ නොවන වචන කපා හරින්න)

11 - 295

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.